(පිටු අංක:37)

(ඇමුණුම:4)

යොමු අංකය:මපස/ජී/12/89
මධ්‍යම පළාත් සභාවේ සභා ලේකම් කාර්යාලය,
තැ:පෙ:92,යටිනුවර වීදිය - මහනුවර
1990 ජනවාරි මස 22 දින.

සියලුම ගරු මැති/ඇමතිවරුන්ගේ
දැන ගැනීම සඳහා.

මධ්‍යම පළාතේ හදිසි අවස්ථා අරමුදල - ප්‍රඥප්තිය

පළාත් සභා රාජ්‍ය අමාත්‍යාංශයේ නීති උපදේශක වරයාගේ අනුමැතිය හා මධ්‍යම පළාතේ ගරු ආණ්ඩුකාරතුමාගේ එකඟත්වය ලැබ සභාගත කිරීම පිණිස යොමුකර තිබෙන 1990 අංක:02 දරණ ප්‍රඥප්තිය ලෙස හැඳින්වෙන 'හදිසි අවස්ථා අරමුදල් ප්‍රඥප්තිය' - 1990.01.30 දිනට නියමිත සභා රැස්වීමට ඉදිරිපත් කරනු ලබන බැව් දන්වමි. මෙහි සිංහල හා ඉංග්‍රීසි අනුවාද ඔබතුමන්ලාගේ දැන ගැනීම පිණිස යවා ඇත.

[illegible]
සභා ලේකම්,
මධ්‍යම පළාත් සභාව.

එච්/-

---

(இணைப்பு:4)

தொடர் இல: மமாச/ச/12/89
மத்திய மாகாண சபையின் சபைச்செயலகம்
த.பெ. 92 யட்டிநுவர வீதி - கண்டி
22 ஜனவரி [illegible] 1990

அனைத்து கௌரவ உறுப்பினர்களின்/
அமைச்சர்களின் கவனத்திற்காக

மத்திய மாகாண அவசரகால நிதியம் - சட்டவாக்கம்

மாகாண சபை இராஜாங்க அமைச்சின் சட்ட ஆலோசகரின் அங்கீகாரமும் மத்திய மாகாண கௌரவ ஆளுநரின் உடன்பாடும் பெறப்பட்டு சபையில் சமர்ப்பிப்பதற்காக எமக்கு அனுப்பி வைத்துள்ள 1990 ஆம் ஆண்டின் 12 ஆம் இலக்க சட்டவாக்கம் என எடுத்துக்காட்டப்படும் 'அவசரகால நிதியம்- சட்டவாக்கம்' 30.01.1990 திகதியன்று சபையில் சமர்ப்பிக்கப்படும் என அறிய தருகின்றேன். இதன் சிங்கள/ஆங்கில மொழிபெயர்ப்புகள் தங்களின் கவனத்திற்காக இத்துடன் இணைக்கப்பட்டுள்ளன.

சபைச் செயலாளர்
மத்திய மாகாண சபைச்செயலகம்

ஜேஸ்/

## මධ්‍යම පළාතේ 1990 අංක: 02 දරණ හදිසි අවස්ථා අරමුදල ප්‍ර ඥ ප් ති ය

( 1990..03..07.. දින අනුමත කරන ලදි )

1987 අංක: 42 දරණ, පළාත් සභා පනතේ 20(1) වගන්තිය යටතේ හදිසි අවස්ථා අරමුදලක් පිහිටුවීම පිණිසද, ඊට සම්බන්ධ සහ අනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිසද වූ ප්‍රඥප්තියකි.

ශ්‍රී ලංකා ප්‍රජා තන්ත්‍රික සමාජවාදී ජනරජයේ මධ්‍යම පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

කෙටි නාමය

1. මේ ප්‍රඥප්තිය 1990 අංක: 02 හි හදිසි අවස්ථා අරමුදල ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, එය ආණ්ඩුකාරවරයා විසින් අනුමත කළ දිනයේ සිට ක්‍රියාත්මක වන්නේය.

පළාතේ හදිසි අවස්ථා අරමුදල:

2. මධ්‍යම පළාතේ අනපේක්ෂිත වියදම් දැරීමේ අරමුණින් ( මෙහි මින් මතු අරමුදල යනුවෙන් සඳහන් කරනු ලබන ) හදිසි අවස්ථා අරමුදලක් මෙයින් ඇති කරනු ලැබේ.

II. රුපියල් දශ ලක්ෂ එක(1) ක මුදලක් පළාත් අරමුදලෙන් මෙම අරමුදලට බැර කළයුතු අතර, එම මුදල අරමුදලේ කොටසක් විය යුතුය.

III. පළාත් සභාව විසින් සම්මතාදිත ප්‍රඥප්ති මඟින් කලින් කලට නිර්ණය කෙරෙන සියලු මුදල් මෙම අරමුදලට බැරකළ යුතුය.

අරමුදලෙන් අත්තිකාරම් ගෙවීම 20(2) වගන්තිය අනුව කළ යුතුය.

3. අරමුදලෙන් අත්තිකාරම් ගෙවීමේදී 1987 අංක: 42 දරණ පළාත් සභා පනතේ 20 (2) උප වගන්තියේ දැක්වෙන විධි විධාන , අනුගමනය කළ යුතුය.

අරමුදලේ භාරකාරත්වය ආණ්ඩුකාරවරයා යටතේ විය යුතුය.

4. අරමුදලේ භාරකාරත්වය ආණ්ඩුකාරවරයා යටතේ විය යුතු අතර, ඉන් කෙරෙන සියලු අත්තිකාරම් ගෙවීම් ඔහු අතින් සිදු විය යුතුය.

---------------

සි/-

(පිටු අංක:19) Annexure 4.

# EMERGENCY FUND STATUTE NO. 42 OF 1990 OF THE PROVINCIAL COUNCIL OF THE CENTRAL PROVINCE

A statute for the establishment of an Emergency Fund under Section (20) (1) of the Provincial Councils Act No. 42 of 1987 and for matters connected therewith or incidental thereto.

BE IT PASSED BY THE PROVINCIAL COUNCIL OF THE CENTRAL PROVINCE OF THE DEMOCRATIC SOCIALIST REPUBLIC OF SRI LANKA AS FOLLOWS:

Short title

1. This statute may be cited as the "Emergency Fund Statute No. 02 of 1990 and shall come into operation on the date of receiving the assent of the Governor.

Emergency Fund of the Province.

2. (1) An "Emergency Fund of the Central Province(hereinafter referred to as the "Fund") is hereby established for the purpose of meeting unforeseen expenditure.

(2) A sum of One million Rupees shall be paid out of the Provincial Fund to the Fund and such sum shall form part of the Fund.

(3) There shall be paid into the Fund all such moneys as may from time to time be determined by statute made by the Provincial Council of the Province.

Section 20 (2) to apply to advances from the Fund.

3. The provisions of sub-section (2) of Section 20 of the Provincial Councils Act No. 42 of 1987 shall apply to advances made out of the Fund.

Custody of the Fund to be under the Governor.

4. The custody of the Fund shall be under the Governor and all advances therefrom shall be made by him.